
# අක්කර බදු ක්‍රියාවට නැංවීමේ ක්‍රියාවලිය



**02.1 හැඳින්වීම**

නිතිපතා හෝ ස්ථිර ව කෙරෙන ගොවිතැනකට යටත් ඉඩම් මත නියම කර අය කර ගනු ලබන බද්දකි. අක්කර බද්ද අය කිරීමට බලය ලැබී ඇත්තේ ප්‍රාදේශීය සභාවලට පමණි.

**02.2 නෛතික අධිකාරිය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (3) වගන්තියේ සිට 166 දක්වා වන වගන්ති.

**02.3 සුදුසුකම්**

(අ) ප්‍රාදේශීය සභා සීමාවක් තුළ පිහිටි ස්ථිර හෝ නිති පතා වගාවට යටත් කර ඇති ඉඩම්.

(ආ) හෙක්ටයාර් 5 කට වැඩි ඉඩමක් විය යුතුය.

(ඇ) හෙක්ටයාර් 5 කට වඩා අඩු ඉඩම්වලින් අක්කර බදු අයකර ගැනීමට විශේෂ කලාපයක් ලෙසට විෂය භාර ඇමතිවරයා විසින් ප්‍රකාශයට පත්කර තිබිය යුතු වන අතර එසේ ප්‍රකාශයට පත්ව ඇති පළාත් පාලන ආයතන වලට එම වපසරියෙන් යුතු වන ඉඩම් මත අක්කර බද්දක් පනවා අයකර ගැනීමට හැකියාව ඇත.

(ඈ) ප්‍රාදේශීය සභාව විසින් අදාළ දේපළ වල වපසරිය මත අයකරනු ලබන අක්කර බද්ද කවර ආකාරද යන වග එළඹෙන වර්ෂයට මත්තෙන් සභාව විසින් තීරණය කර ගැසට් පත්‍රයක් මඟින් භාෂාත්‍රයෙන් ප්‍රකාශයට පත් කොට තිබිය යුතුය.

සටහන : වරිපනම් බද්දක් ප්‍රකාශයට පත්ව ඇති දියුණුකළ ප්‍රදේශවල ඇති ඉහත වපසරියෙන් යුතු ඉඩම් සඳහා අක්කර බද්දක් නියම නොකළ යුතුය.

**02.4 ගාස්තු**

i. හෙක්ටයාර් 5 කට වැඩි ඉඩම් මත එක් එක් හෙක්ටයාරයකට රු. 10/= ක උපරිමයක් මත අක්කර බද්ද නියම කොට අයකර ගත හැකිය.

සටහන : අක්කර බද්ද කාර්තුවකට හෝ සම්පූර්ණ වසරටම ගෙවිය හැකි ය.

1. සම්පූර්ණ වසර සඳහාම ගෙවිය යුතු වන මුදල අදාළ වර්ෂයේ පළමු වන මාසය තුළ දී ගෙවනු ලබන්නේ නම් 10% ක වට්ටමක් පිරිනමනු ලැබේ.
2. කාර්තුවක් සඳහා ගෙවිය යුතු වන මුදල අදාළ කාර්තුවේ පළමු වන මාසය තුළ දී ගෙවනු ලබන්නේ නම් 5% ක වට්ටමක් පිරිනමනු ලැබේ.

ii. හෙක්ටයාර් 5කට අඩු නමුත් හෙක්ටයාර් එකකට නොඅඩු ඉඩම් මත රු. 50/= ක අක්කර බද්ද නියම කොට අයකර ගත හැකිය.

සටහන : අක්කර බද්ද කාර්තුවකට හෝ සම්පූර්ණ වසරටම ගෙවිය හැකි ය.

1. සම්පූර්ණ වසර සඳහාම ගෙවිය යුතු වන මුදල අදාළ වර්ෂයේ පළමු වන මාසය තුළ දී ගෙවනු ලබන්නේ නම් 10% ක වට්ටමක් පිරිනමනු ලැබේ.
2. කාර්තුවක් සඳහා ගෙවිය යුතු වන මුදල අදාළ කාර්තුවේ පළමු වන මාසය තුළ දී ගෙවනු ලබන්නේ නම් 5% ක වට්ටමක් පිරිනමනු ලැබේ.

**02.5 කාර්යය පටිපාටිය**

| අනු අංකය | පටිපාටිය | කාල සීමාව | අධිකාරිය |
|---|---|---|---|
| 1 | බදු ගෙවන්නාට සත්තේක්ෂණ නිවේදනය භාරදීම. | දෙසැම්බර් 31 ට පෙර | ලේකම් (ආදායම් පරීක්ෂක / බලය පැවරුණු නිලධාරියා) |
| 2 | සත්තේක්ෂණ විරෝධතා පොත ප්‍රදර්ශනය කිරීම | දෙසැම්බර් 01 වන දින සිට ජනවාරි 31 දක්වා | ලේකම් |
| 3 | අක්කර බද්ද අයකර ගැනීම සහ ලදුපත නිකුත් කිරීම | | පෙරටු කාර්යාල නිලධාරි / මුදල් අයකැමි |

**02.6 සත්තේක්ෂණ නිවේදනයේ දැක්වෙන ඉඩමේ ප්‍රමාණය බදු ගෙවන්නා විසින් පිළිගනු නොලබන්නේ නම් පහත ක්‍රියා පටිපාටිය අනුගමනය කළ යුතුය.**

| අනු අංකය | පටිපාටිය | කාල සීමාව | අධිකාරිය |
|---|---|---|---|
| 1 | සත්තේක්ෂණය පිළිබඳව ලිඛිත විරෝධතාවක් ඉදිරිපත් කළ යුතුය. | සත්තේක්ෂණ නිවේදනය ලැබූ දින සිට දින 30 ක් ගතවීමට පෙර | |
| 2 | විරෝධතාව දක්වන තැනැත්තාට පරීක්ෂණය සඳහා පැමිණෙන ලෙසට දැන්වීම. | විරෝධතාව ලැබූ දින සිට මාසයක් ඇතුළත. | ලේකම් |
| 3 | විරෝධතා පරීක්ෂණය පැවැත්වීම | මාස තුනක් ඇතුළත | සභාපති සහ ලේකම් |
| 4 | විරෝධතා පරීක්ෂණයේ තීරණය ලිඛිතව දැන්වීම. | පරීක්ෂණය අවසන් වූ දින සිට සති 02 ක් ඇතුළත. | ලේකම් |

**02.7 බදු ගෙවන තැනැත්තා තීරණයට විරුද්ධ වන විට නීතිමය සහනය,**

මෙම තීරණයට බදු ගෙවන තැනැත්තා විරුද්ධ වන්නේ නම් 1987 ප්‍රාදේශීය සභා පනතේ 142 වන වගන්තිය යටතේ නීතිමය සහනයක් පැතීමේ අයිතිය ඔහු සතු වේ. ඒ අනුව ඔහු විසින් අක්කර බද්දේ ප්‍රමාණය රු. 1500/= නොඉක්මවන විට මහේස්ත්‍රාත් අධිකරණයේ ද රු. 1500/= ඉක්මවන විට දිසා අධිකරණයේ ද නඩුවක් ගොනු කිරීමට අයිතිය ඇත.

සටහන : අධිකරණයේ තීරණය අවසානාත්මක වේ.

**02.8 බද්ද ගෙවීම පැහැර හැරීමේ ප්‍රතිවිපාක**

(අ) ගෙවීම පැහැර හරින සෑම කාර්තුවක්ම අවසානයේ ලේකම්වරයා විසින් පැහැර හරින්නා සතු චංචල දේපළ තහනමට ගෙන විකුණා බදු මුදල අය කර ගැනීමට වරෙන්තුවක් නිකුත් කරනු ඇත. මෙසේ නිකුත් කරනු ලබන වරෙන්තුවේ ගාස්තුව වෙනුවෙන් හිඟ බදු මුදලෙන් 10% ක මුදලක් අතිරේකව අයකරගනු ඇත.

(ආ) වරෙන්තුව නිකුත් කිරීමෙන් අනතුරුව දේපළෙහි පදිංචිකරු සතු හෝ ඒ දේපළ මත තිබෙන කවර හෝ තැනැත්තෙකුට අයත් චංචල දේපළ තහනමට ගෙන විකුණා අයවීමට ඇති හිඟ මුදල අයකර ගනු ඇත.

(ඇ) තහනමට ගත හැකි චංචල දේපළක් නොමැති විටක නිශ්චල දේපළ තහනමට ගැනීම සඳහා අධිකරණ ක්‍රියාමාර්ග ගනු ඇත.

## 02.9 වරෙන්තුව නිකුත් කිරීමේ කාර්යය පටිපාටිය

| අනු අංකය | පටිපාටිය | කාල සීමාව | අධිකාරිය |
|---|---|---|---|
| 1 | කලින් කාර්තුවේ පැහැර හරින්නන්ගේ ලේඛනය සකස්කර ලේකම් මඟින් සභාපති වෙත ඉදිරිපත් කිරීම. | සෑම කාර්තුවකම මුල් මාසයේ 05 වන දිනට ප්‍රථම | විෂය භාර නිලධාරි |
| 2 | පදිංචිකරුට සිහි කැඳවීම (ශබ්ද විකාශන යන්ත්‍ර හෝ ලිපි මඟින්) | වරෙන්තුව නිකුත් කිරීමට ප්‍රථම | ආදායම් පරීක්ෂක/ බලය පැවරුණු නිලධාරියා |
| 3 | මහ නගර සභා ආඥා පනතේ හයවන උපලේඛනය යටතේ විස්තර කරනා වරෙන්තු ආකෘතියට සාරානුකූලව ප්‍රාදේශීය සභා සඳහා මෙහි ඇමුණුම් 1 හි පෙන්නුම් කරනා වරෙන්තු නිවේදනය සකස් කර නිකුත් කිරීම. | සෑම කාර්තුවකම මුල් මාසයේ 10 වන දිනට ප්‍රථම | ලේකම් |
| 4 | තවදුරටත් පැහැර හරින්නන්ගේ චංචල දේපළ තහනමට ගැනීම | වරෙන්තුව නිකුත් කළ දින සිට දින 30 ට පෙර | ආදායම් පරීක්ෂක / වරෙන්තුව ලැබූ වෙනත් නිලධරයා |
| 5 | තහනමට ගත් දේපළ වෙන්දේසි කිරීම පිළිබඳ නිවේදනය පුවත් පත්වල සහ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කිරීම. | දේපළ තහනමට ගත් දින සිට දින 28 ට පසු එහෙත් දින 42 ට පෙර | ලේකම් |
| 6 | වෙන්දේසියේ දිනයේ වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර තහනමට ගත් භාණ්ඩ අයිතිකරු විසින් හිඟ මුදල් ගෙවන්නේනම් භාණ්ඩ නිදහස් කර ගැනීමට ඉඩ දීම. | වෙන්දේසිය පවත්වන දිනයේ වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර | ලේකම් |
| 7 | භාණ්ඩ වෙන්දේසිය | තහනමට ගත් දින සිට දින 42 ට පෙර | ආදායම් පරීක්ෂක / බලය පැවරුණු නිලධාරියා |
| 8 | චංචල දේපළ විකිණීමෙන් ලද මුදලින් හිඟ මුදල්, වරෙන්තු ගාස්තු සහ වෙනත් අතිරේක ගාස්තු අදාළ ආදායම් ශීර්ෂවලට බැර කොට ඉතිරිය තැන්පත් කිරීම. | වෙන්දේසිය පවත්වන දින | ආදායම් පරීක්ෂක / බලය පැවරුණු නිලධාරියා |

| අනු අංකය | පටිපාටිය | කාල සීමාව | අධිකාරිය |
|---|---|---|---|
| 9 | පැහැර හැරිය තැනැත්තා ඉල්ලා සිටියහොත් අතිරික්ත මුදල ආපසු ගෙවීම | දේපළ තහනමට ගත් දින සිට මාස 12 ක් ගතවීමට පෙර | ලේකම් |
| 10 | අතිරික්තය ඉල්ලා නොමැති විට තැන්පත් ගිණුමේ ඇති මුදල් ආදායමට ගැනීම | දේපළ තහනමට ගත් දින සිට මාස 12 ක් ගතවූ පසු | ලේකම් |
| 11 | තහනමට ගත හැකි චංචල දේපළ නොමැති නම් පැහැරහරින්නා වෙත ප්‍රාදේශීය සභා පනතේ පස්වන උපලේඛන ප්‍රකාර නිවේදනය භාරදීම. | වරෙන්තුව නිකුත් කළ දින සිට දින 30 ක් ගතවීමට මත්තෙන් | ලේකම් |
| 12 | පස්වන උපලේඛනයේ නිවේදනයට අනුගත නොවන විටක නිශ්චල දේපළ තහනමට ගැනීම සඳහා 166 වන වගන්තිය අනුව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම. | පස් වන උප ලේඛනය භාර දුන් දින සිට දින 30 ට පසු | ලේකම් |